## ලංකාපුර ප්‍රාදේශීය සභාව
## පොළොන්නරුව දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 29 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2009 මාර්තු 26 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය.

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව ලංකාපුර ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ලංකාපුර ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

විගණනයේදී නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | ගිණුම්කරණ අඩුපාඩුව | විෂයයන් ගණන | වටිනාකම |
|---|---|---|---|
| | | | රු. |
| (අ) | මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරීම් | 04 | 456,058 |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වීම් | 03 | 31,187 |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දැක්වීම් | 03 | 51,133 |

1.3.2 නොසැසඳුනු ගිණුම්.

(අ) ගිණුම් විෂයයන් 02 කට අදාල මූල්‍ය ප්‍රකාශනවල දැක්වුනු ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වුනු ශේෂයයන් රු. 58,781 කින් සැසඳී නොතිබුණි.

(ආ) ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් හැර අනෙකුත් වත්කම්වල වටිනාකම ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමට සමාන විය යුතු වුවත් එම වටිනාකම් අතර රු. 3,490,309 ක නොසැසඳීමක් විය.

1.3.3 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ07 ක වටිනාකම රු. 3,345,508 ක් විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොවීම නිසා වටිනාකම රු. 51,757,912 ක් වූ ගිණුම් විෂයයන් 11 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති,රීති, රෙගුලාසි විධි විධානවලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති | |
| | රීති 59 හා 67 | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(1) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුල සමීක්ෂණයක් සිදුකර බල ප්‍රදේශයේ කර්මාන්තවල හා වෙළඳ ස්ථාන අඩු වැඩිවීම් ඇතුළත් ලැයිස්තුවක් අදාල වර්ෂයේ මාර්තු 31 දිනට පෙර පිළියෙල කළයුතු වුවද එවැනි ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. |
| (ආ) | 2007 දෙසැම්බර් 19 දිනැති අංක 1528/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනය | සභාපතිවරයා විසින් මාසිකව දැරිය යුතු ඉන්ධන සීමාව ලීටර් 400 කට වැඩි නොවිය යුතු වුවද සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය තුලදී එම සීමාව ඉක්මවා රු. 102,748 ක අගයකින් යුතු ඉන්ධන ලීටර් 1381 ක් භාවිතා කර තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |

| | | |
|---|---|---|
| (i) | මු.රෙ. 396 | අංක 232-1-001-2-7744487 දරන ප්‍රාදේශීය සභා ජංගම ගිණුමෙන් 2008 වර්ෂයේදී නිකුත් කරන ලද රු. 47,063 ක් වටිනා ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) | මු.රෙ. 756 | ප්‍රාදේශීය සභා කාර්යාලයේ හා ඊට අනුබද්ධ පුස්තකාලය, ආයුර්වේද බෙහෙත් ශාලාව යන ආයතනවල සමාලෝචිත වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

## 02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,761,897 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 983,893 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය.

#### 2.2.1 ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010<br>ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය | 2009<br>ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| (අ) | වරිපනම් හා බදු | 13 | 18 | - | 686 | 28 | - |
| (ආ) | බදු කුලී | 5,759 | 7,046 | 914 | 4,001 | 4,970 | 433 |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | 944, | 622 | - | 1,357 | 736 | - |
| (ඈ) | වෙනත් ආදායම් | 19,949 | 13,558 | 3,714 | 15,100 | 12,027 | 14,489 |

2.2.2 මස් කඩ කුලී

2003 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා වසර 05 ක රු. 310,008 ක හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 කඩ කාමර කුලී

වසරකට වැඩි කලක් ගතවූ රු. 301,537 ක් වූ කඩ කාමර හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 උසාවි දඩ

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දින දක්වා අය කර පළාත් ආදායම් කොමසාරිස් වෙත එවා ඇති රු. 2,313,183 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.5 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයවිය යුතු මුද්දර ගාස්තු ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.6 වෙනත් ආදායම්

හඳුනා නොගත් රු. 1,290,000 ක් වූ හිඟ හිටි වෙනත් ආදායම් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3 වියදම් ව්‍යුහය.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමග පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 14,216 | 10,509 | 3,707 | 13,222 | 10,295 | 2,927 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අනෙකුත් | 7,143 | 6,973 | 170 | 7,859 | 6,482 | 1,377 |
| උප එකතුව | 21,359 | 17,482 | 3,877 | 21,081 | 16,777 | 4,304 |
| ප්‍රාග්ධන වියදම | 2,600 | 9,693 | (7,093) | 6,490 | 17,020 | (10,530) |
| මුළු එකතුව | 23,959 | 27,175 | (3,216) | 27,571 | 33,797 | (6,226) |

2.4 මානව සම්පත් කළමනාකරණය.

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|---|
| (අ) | මාණ්ඩලික | 02 | 01 |
| (ආ) | ද්විතීයික | 06 | 06 |
| (ඇ) | ප්‍රාථමික | 20 | 45 |

2.5 වත්කම් කළමනාකරණය.

2.5.1 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්.

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) සභාවට ලබාගත් කාල වකවානු හා මිල ගණන් අනාවරණය නොවූ අංක 108 ශ්‍රී 1706 දරන යතුරු පැදිය වසර ගණනාවක් සිට නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) 2005 වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු .400,000 ක් වටිනා තාර බැරල් තොගයක් ප්‍රාදේශීය සභා පරිශ්‍රය තුළ ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පැවතුණි.

(ඇ) 2007 වර්ෂයේදි රු. 17,000 ක් වැයකර මිලදී ගෙන තිබූ බ්ලොක් ගල් නිෂ්පාදන යන්ත්‍රය ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

2.5.2 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබුණු ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 656,600 ක් විය.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන උපකරණ කට්ටලය ප්‍රයෝජනයට ගනිමින් සමාලෝචිත වර්ෂයේ සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන බේකරියක් ආරම්භ කර තිබුණු අතර අවශ්‍ය අමුද්‍රව්‍ය මිලට ගැනීම හා සේවක වැටුප් ගෙවීම සඳහා 2010 ඔක්තෝබර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා රු. 551,363 ක් වැයකර තිබුණි. එහෙත් නිෂ්පාදන අලෙවියෙන් ලද ආදායම රු.363,639 ක් වූ අතර රු. 187,724 ක මෙහෙයුම් අලාභයක් සිදුවී තිබීමෙන් සැලසුම්ගත මෙහෙයුම් සාර්ථක වී නොතිබුණි.

2.7 ද්‍රව්‍ය අක්‍රමිකතා

සෝමාවතිය පූජා පුදබිමියේ රථ ගාල් කුලී අයකිරීම සඳහා 2010 වර්ෂයේදී රු. 15,800 ක් වැයකර කුවිතාන්සි පොත් 300 ක් මුද්‍රණය කර තිබුණු අතර එම කුවිතාන්සි පොත් මගින් රථ ගාල් සඳහා කුලී අයකළ ආදායම් සභාවට ලැබී නොතිබුණි. 2010 පෙබරවාරි 08 දින කරන ලද විගණන පරීක්ෂාවේදී අදාල කුවිතාන්සි පොත් සභාවේ නොතිබුණු අතර එම කුවිතාන්සි පොත් සභාවට ලැබුණු බවට, භාරගත් බවට හෝ නිකුත් කළ බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවීය.

2.8 ප්‍රමාණවත් අධිකාර බලයකින් ආවරණය නොවූ ගණුදෙනු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තියේ විධි විධාන අනුව අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුඥාවක් නොමැතිව බල ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සැමරීම වෙනුවෙන් රු. 28,000 ක් සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් වැයකර තිබුණි.

2.9 කාර්ය සාධනය

(අ) සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාර් සැලැස්මක් නොවීම

(i) 1989 ජුලි 16 දිනැති අංක පී.ෆ්.ඞී. 52 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා 2003 ජුනි 02 දින හා අංක පී.ෆ්.ඞී. 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති කාර්යයන්, ඉදිරි වර්ෂවලදී ඉටුකිරීමට සැලසුම් කර ඇති ආකාරය දැක්වෙන, සංයුක්ත සැලැස්මක් පිළියල කර නොතිබුණි.

(ii) සභාවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා මූල්‍ය, මානව හා භෞතික සම්පත් නිසි කළමනාකරණ ප්‍රවේශයකට යොමුකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාර් සැලැස්මක් (මූල්‍ය හා භෞතික) පිළියෙල කර නොතිබිණි.

(ආ) වාර්ෂික අයවැය ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ ස්වයං උත්පාදන ආදායම රු. 26,655,180 ක් වුවද රැස්කර තිබුණු ආදායම රු. 21,243,748 ක් වූ අතර ප්‍රතිශතය 80% ක් විය.

2.10 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) ණයගැති හා ණයහිමි පාලනය